මගේ අංකය : GA/2/7/297/2018 (වෙළුම I)
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.
2024.06.30

සියළුම අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/
වාරිමාර්ග අධ්‍යක්ෂ/ ව්‍යාපෘති අධ්‍යක්ෂ/
ප්‍රධාන නේවාසික ඉංජිනේරු/ ප්‍රධාන ඉංජිනේරු/
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු/ නේවාසික ඉංජිනේරු,

**වාර්ෂික ස්ථාන මාරුවීම් - 2025 - තාක්ෂණ සහායක (වාරිමාර්ග /යාන්ත්‍රික)**

වාරිමාර්ග දෙපාර්තමේන්තු තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) නිලධාරින්ගේ 2025 වාර්ෂික ස්ථාන මාරු කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. කොන්ත්‍රාත් පදනමින් සේවය කළ කාලයද සලකා **වසර 5කට වැඩි කාලයක් එකම ස්ථානයේ සේවය කරන තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) නිලධාරින්, ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන හා අපේක්ෂා නොකරන** සියළුම තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) නිලධාරින් විසින් අමුණා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.07.31 දින හෝ ඊට පෙර** මා වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුවේ. තම කාර්යාලයේ ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධාරින්ගේ අයදුම්පත් අදාළ අංශ ප්‍රධානීන්/ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු / නේවාසික ඉංජිනේරු විසින් හැකි ඉක්මනින් තම අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් / වාරිමාර්ග අධ්‍යක්ෂ / ප්‍රධාන නේවාසික ඉංජිනේරු / ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔවුන් විසින් තම උප දෙපාර්තමේන්තුවේ/ අංශයේ/ ව්‍යාපෘතියේ සියළුම කාර්යාල වල අයදුම්පත් එකතු කර නියමිත දිනට පෙර එකම ආවරණ ලිපියක් මඟින් මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුවේ. වසර 5කට වැඩි කාලයක් එකම ස්ථානයේ සේවය කළ නිලධාරින් දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීම්වලට යටත්වන අතර ඒ සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සලකා බලනු නොලැබේ.

02. වර්ෂය මැදදී තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) නිලධාරින් මාරු කිරීම් සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බැලීම දුෂ්කර වන බව විශේෂයෙන් සටහන් කර ගත යුතුවේ.

03. ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන, අපේක්ෂා නොකරන සහ අවුරුදු 5කට වඩා එකම ස්ථානයේ සේවය කරන සියළුම තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) නිලධාරින්ගෙන් මෙම ඉල්ලුම්පත් ලබා ගෙන එක් එක් අංශයට / කොට්ඨාසයට අයත් අයදුම්පත් වෙන් වෙන් වශයෙන් අංක යොදා මේ සමඟ ඇති ආකෘතියට අනුව උපලේඛන ගත කර A3 ප්‍රමාණයේ කඩදාසියක ඒකාබද්ධ ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කිරීමට අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් / වාරිමාර්ග අධ්‍යක්ෂ / ප්‍රධාන නේවාසික ඉංජිනේරු / ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් කටයුතු කළ යුතුය.

04. මෙම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සමග තම කලාපයට අයත් දැනට සේවයේ නියුතු සියලුම **තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික)** නිලධාරීන්ගේ වර්තමාන සේවා ස්ථානය සඳහන් කළ නාම **ලේඛනයක්** මා වෙත ලැබීමට කටයුතු කළ යුතුය.

05. අමුණා ඇති ඉල්ලුම් පත්‍රයේ 10 වැනි ඡේදය ප්‍රකාර සේවයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු කරනු ලැබුවහොත් නිලධාරියා මාරු වී යාමට කැමති සේවා ස්ථාන තුනක් (03ක්) මනාපය මත සඳහන් කර නොමැත්තේ නම් ඔවුන් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවයට කැමැත්ත ප්‍රකාශ කළාසේ සලකා කටයුතු කරනු ලැබේ.

ඉංජි.අජිත් ගුණසේකර

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
2. ලේකම්, තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික) නිලධාරි සංගමය